# 19

හිම්දිරි යාමේ පිණිකැට දිලිසෙනවා
සමිඳුගේ මූහුණේ හසරැල් මතුවෙනවා
ආදරේ නමින් ජීවිතේ පුදා
එදත් අදත් හෙටත් හිනා වෙලා
ජේසුනි මේ ඔබද – ජේසුනි මා ඔබේද
කියන්න ජේසුනි /// මා ඔබේද

ගිණි මද්දහනේ තණපත් මැලවෙනවා
දස දහසක් පව් මාගෙන් සිදුවෙනවා
ආදරේ නමින් පව් කමා වෙලා
රන්තරන් හදක් මටත් දෙන්න

නිසසල රැයෙහි ඔබව මතක් වෙනවා
කළ පව් සිහිවී මගේ හිත කකියනවා
ආදරේ නමින් සුසුම් මකා හදේ
ආදරේ මටත් කියා දෙන්න

